# සංක්ෂිප්තය


දරුවෙකුගේ අධ්‍යාපනික සාධනය සාර්ථක විමට බලපාන සාධක රැසක් දක්නට පුළුවන. ඒවා අභ්‍යන්තර සාධක හා බාහිර සාධක වශයෙන් හඳුනා ගත හැකිය. දරුවා තුළම පවතින සාධක අභ්‍යන්තර සාධක වශයෙන්ද බැහැරින් බලපෑම් කරන සාධක බාහිර සාධක වශයෙන්ද දැක්විය හැකිය. මෙම සාධක දෙවර්ගය අතර කරුණු රාශියක් ඇතුළත්ව ඇති බව දක්නට ලැබේ. මෙම සාධක අතර දරුවාට බැහැරින් බලපාන සාධකයක්වූ පවුල් පසුබිම මුල්කර ගෙන මෙම අධ්‍යයනය සිදු කෙරිණි.

ලංකාවේ සාධනය මනිනු ලබන විවිධ විභාග දක්නට ලැබේ. මෙම අධ්‍යයනයේදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සාධන තත්වයන් අවධානයට ලක් කෙරිණි. ඒ අනුව පළමු පරිච්ඡේදයෙන් අධ්‍යයන ගැටලුව, ගැටලුවේ පසුබිම, පවුල හා එහි කාර්යයන් අධ්‍යාපන සාධනය අධ්‍යයනයේ වැදගත්කම පද විග්‍රහය යන කරුණු ඉදිරිපත් කෙරේ.

අධ්‍යාපන සාධනය පවුල් පසුබිම බලපාන ආකාරය සම්බන්ධව දේශිය වශයෙන් හා විදේශිය වශයෙන් කර ඇති පර්යේෂණ ආශ්‍රයෙන් සාහිත්‍ය විමර්ශනය කරමින් දෙවන පරිච්ඡේදය ගොඩ නැගිණි. ඒ පර්යේෂණවලින් හෙළිදරව් වන්නේ දෙමව්පියන්ගේ සමාජ, ආර්ථික, අධ්‍යාපනික තත්වයන්ද ආරය හා පරිසරයද, ආකල්ප සාරධර්ම, පවුල් සංස්කෘතියද දරුවන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි බලපාන ආකාරයයි.

පර්යේෂණය මෙහෙය වන ආකාරය පදනම් කරගෙන තෙවන පරිච්ඡේදය ගොඩ නැගිණි. පර්යේෂණයේ ප්‍රධාන අරමුණ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සාධනය කෙරෙහි පවුල් පසුබිම බලපාන ආකාරය පිළිබඳවයි. ඒ අනුව පවුල් පසුබිම හඳුනා ගත හැකි ආකාරයෙන් සෙසු අරමුණු ගොඩ නැගිණි. දෙමව්පියන්ගේ ආර්ථික, සාමාජික, අධ්‍යාපනික තත්වය ශිෂ්‍ය සාධනයට කරන බලපෑම හඳුනා ගැනිම, දෙමව්පියන්ගේ සාධනයට ගන්නා ක්‍රියා මාර්ග, හා ශිෂ්‍ය සාධනය අතර සම්බන්ධතාව, දෙමාපිය අපේක්ෂණ හා ශිෂ්‍ය සාධනය අතර සම්බන්ධතාවක් පවතීදැයි සොයා බැලීම, පවුල් සංස්කෘතිය ඉගෙනුම් පරිසරය සාධනයට කරන බලපෑම හඳුනාගැනීම, ගුරු දෙගුරු සම්බන්ධතා හා ශිෂ්‍ය සාධන අතර සම්බන්ධතාවක් පවතීදැයි සොයා බැලීම සෙසු අරමුණු විය.

පවුල් පසුබිම ආශ්‍රිත තොරතුරු හෙළිවන ආකාරයෙන් දත්ත රැස් කිරීමේ මිනුම් උපකරණ සකස් කෙරිණි. ප්‍රධාන උපකරණය වුයේ ගුරු ශිෂ්‍ය දෙමාපිය ප්‍රශ්නාවලීන්ය. දෙහිඕවිට අධ්‍යාපන කලාපය ආශ්‍රයෙන් තෝරාගත් නියැදියෙන් දත්ත රැස් කෙරිණි. ලැබුණු දත්ත SPSS ( statistical Pakage in Social Sciences) මෘදුකාංගයට ඇතුළත් කිරීමෙන් ලද ප්‍රතිඵල අනුව දත්ත විශ්ලේෂණය කෙරිණි. එහිදී ද වගු ප්‍රතිශත උපයෝගී කර ගන්නා ලදී.

දත්ත විශ්ලේෂණය හා අර්ථකථනය කළ ආකාරය සිව්වන පරිච්ඡේදය දැක්වේ. ඒ ඇසුරින් ඉදිරිපත් කළ නිගමන හා යෝජනා පස්වන පරිච්ඡේදයේ දැක්වේ.